# නදී සමග දෙපැයක්

ළමා නාට්‍ය ශිල්පිනියක ලෙස වේදිකාව හරහා රංගනයට අවතීර්ණ වන නදී කම්මැල්ලවීර පසු කලෙක සිනමා නිළියක් ලෙස ජාත්‍යන්තර සිනමාව දක්වා දිගු ගමනක නියැලෙන්නීය. ඇය ප්‍රවීණ වේදිකා නාට්‍ය ශිල්පිනියක වන සෝමලතා සුබසිංහ මහත්මියගේ ශිෂ්‍යාවක වන අතර ඇගේ වසර ගනනක වේදිකා, රූපවාහිනී සහ සිනමා රංගනය පිළබඳ අත්දැකීම් ඇසුරින් සිදුකළ කථාබහක් මෙම ලිපියට පාදක වී තිබේ.

**ඔබ රංගන ශිල්පිනියක බවට පත්වීම ඔබේ ජීවිතයේ එක්තරා අහම්බයක්ද? නැත්නම් ඔබේ බලාපොරොත්තුවක්ද?**

**නදී**

එය එකහෙළාම අහම්බයක්. පාසල් වියේදී මා වඩාත් දක්ෂ වුණේ ක්‍රීඩාවට, විශේෂයෙන්ම දිවීම වැනි මලළ ක්‍රීඩා වලට. කිසි දිනෙක මා පාසල් වේදිකාවට ගොඩවෙලා නැහැ. රඟපෑමේ ආශාව මා තුළ තබුණත් ඒ සඳහා අවස්ථාවක් පාසලේදි කිසිවිටෙකත් මට උදාවුණේ නැහැ. මගේ උසස් පෙළ සමය තරමක් ගැටුම් වලින් පිරුණු කැරළි ගැසීම් වලට යොමුවුණු එක්තරා විදියක රැඩිකල් බවක් පෙන්නුම් කරපු අවුල් සහගත තත්ත්වයන්ගෙන් සමන්විත කාල පරිච්ඡේදයක්.




මගේ පියාගේ ආභාෂය නිසා සාහිත්‍යයට ඇති තදබල ඇල්මක් සහිත දැරියක ලෙස මා ගොඩනැගුණත් උසස්පෙළ සඳහා මවිසින් තෝරාගනු ලැබෙන්නේ ගණිත විෂයන්. නමුත් පාසල් මාරුකරන්නට සිදුවීමත් සමඟ ඇතිවන සංකීර්ණතා වලට ඔරොත්තු දී ගත නොහැකිව මා ඉගෙනීම නතර කරන තත්ත්වයට පත්ව සිටියා. මගේ ආදරණීය දෙමව්පියන් නොසිටින්නට ඇතැම් විට අද මා උසස්පෙළවත් නැති අයකු වන්නට ඉඩතබුණා. කෙසේ හෝ අවසානයේ කලා විෂයයන්ගෙන් උසස්පෙළ විභාගයට පෙනී සිටින්නට මා තීරණය කළා. එහිදී නාට්‍ය හා රංග කලාව එක් විෂයයක් හැටියට තෝරා ගැනීමත් හුදු අහම්බයක්. තෝරා ගැනීමට අන්‍යමක් නොවූ තැන ඒ විෂයය තෝරා ගත්තා යැයි කීම වඩාත් නිවැරදියි. එහෙත් අවසානයේ මගේ ජීවිතය ආලෝකමත් කළෙත් නාට්‍ය කලාව යැයි මා අද විශ්වාස කරනවා.

විශ්ව විද්‍යාලයට ඇතුලත් වන තුරු පවතින සංකාන්ති සමයේ එක්තරා දිනයක මගේ පියා සමඟ සෝමලතා සුබසිංහ මහත්මියගේ "යදම් " වේදිකා නාට්‍ය නරඹන්නට ගිය අවස්ථාව මගේ ජීවිතය එක්තරා දුරකට වෙනස් කලා. එම නාට්‍යයේ නයනා හෙට්ටිආරච්චි විසින් සිදු කළ ප්‍රබල වේදිකා රංගනය, රඟපෑම පිළබිඳව වෙනස් කෝණයකින් හිතන්නට මා තුල කිසියම් බලපෑමක් ඇති කළා. නාට්‍යයේ දර්ශනවාරය අවසානයේ මගේ පියා වේදිකාව පිටුපසට වී සෝමලතා සුබසිංහ මහත්මිය සමඟ සාමාන්‍ය කථාබහක යෙදෙමින් සිටියදී ඇගේ නාට්‍ය පුහුණුවීම් නැරඹීමට මා කැඳවා ගන්නැයි යෝජනාවක් කළා. ඒ මොහොතේ එතුමිය මා වෙත දැක්වූ ප්‍රතිචාරය මා තුල සාධනීය පබිදීමක් ඇතිකළා යැයි කීවොත් එය අතිශයෝක්තියක් නොවේ. මව් ගුණය තැවරුණු ඇගේ කථා විලාශයටත් ඈ වෙතින් දිස් වූ අප්‍රමාණ පෞරුෂයටත් මා තදින් ආකර්ශනය වුණා.

**සෝමලතා සුබසිංහ මහත්මියගේ ඇසුර සහ ඇය විසින් ලබාදෙන ලද විශාල පුහුණුව ඒ තරුණ අවධියේ දී ඔබ තුළ ඇතිකළ මානසික වෙනස අද ජීවිතයේ නොයෙකුත් අත්දැකීම් සමග පරිණත වූ කාන්තාවක ලෙස ඔබට දැනෙන්නේ කෙසේද?**

**නදී**

සත්තකින්ම එය ලඝු පිළිතුරකට ගොනුකළ නොහැකි තරම් අති විශාල ජීවිත පරිචයක් ලබා ගත් වකවානුවක්. විශ්ව විද්‍යාල කිහිපයකට ගියත් එකතු කර ගත නොහැකි අත්දැකීම් සම්භාරයක් සහ අවබෝධයක් ලද මිහිරි යුගයක් ලෙස ඒ අවධිය මගේ මනසේ තැන්පත් වී තිබෙනවා. එතුමිය මෑතකදී අප අතරින් වෙන්වී ගියත් අදටත් මා සලකන්නේ ඇය මගේ දෙවන මව් ලෙසටයි.



**එය The Young Pope නමැති ඉංගිරිසි බසින් නිර්මාණය වුණ රූපවාහිනි මාලා නාටකයක්. මෙය Paolo Sorrentino නම් ඉතාලි ජාතික අධ්‍යක්ෂකවරයාගේ නිර්මාණයක්. ඉතිහාසයේ ප්‍රථම වරට වැනිසීයේ අන්තර්ජාතික චත්‍රපට උළෙලට රූපවාහිනී මාලා නාටකයක කථාංග යුගලක් ප්‍රචාරය වීමේ වරම හිමිකරගත්තේ මෙම නිර්මාණයයි.**

**මෙහි ප්‍රධාන චරිත සඳහා Jude Law,Diane Keaton සහ Silvio Orlando රංගනයෙන් දායක වුණා. Jude Law යනු ඔස්කාර් සම්මානය සඳහා දෙවතාවක්ම නාම යෝජනා වූ අද්විතීය නළුවෙක්. තරුණ පාප්වහන්සේ ලෙස රංගනයේ යෙදුණෙ ඔහු. මා එහි නිරූපණය කළේ සුරී නම් වන කන්‍යා සොහොයුරීගේ චරිතය.**

එවකට එතුමිය ඇගේ නව නිර්මාණයක් වූ "හිම කුමාරි" වේදිකා නාට්‍යයට පරිවාර නළුනිළියන් තෝරා ගැනීමේ අරමුණින් වැඩමුළුවක් සංවිධානය කරන බවට දැන්වීමක් "රාවය" පුවත්පතේ පළ කර තබුණා. මා ඒ අනුව අයදුම්පතක් තැපැල්කර සම්මුඛ පරීක්ෂණයට මුහුණ දුන්නා. ඒ වනවිටත් මගේ පියා විසින් එතුමියට මාව හඳුන්වා දී තිබීමත් ඇය වෙතින් යහපත් ප්‍රතිචාරයක් ලැබී තිබීමත් හේතුවෙන් වැඩමුළුවට මා තේරීපත්වේ යැයි හොඳ විශ්වාසයක් මා තුල ගොඩ නැගී තිබුණා.මට හොඳින් ම මතකයි එදින සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ සෝමලතා සුබසිංහ මහත්මියගේ දියණිය කෞශල්‍යා ප්‍රනාන්දුත් සිටියා. යදම් නාට්‍යයේ මා වසඟ කළ දෙබසක් එදින පරීක්ෂණය සඳහා මා විසින් ඉදිරිපත් කරනු ලැබුවා. ඒ වනවිට හිම කුමාරි නාට්‍යයේ ප්‍රධාන චරිතයට ජනප්‍රිය රූපවාහිනී නිළියක් සහ හිම කුමාරි පාසල් වේදිකා නිර්මාණයේ රඟපෑ යුවතියත් පුහුණුවීම් ආරම්භ කර තබුණා. වැඩමුළුව අතරවාරයේ සෝමලතා සුබසිංහ මහත්මිය විශේෂයෙන් මා කෙරෙහි අවධානය යොමු කරන බවක් මට වැටහුණා. එක්තරා අවධියක හිම කුමාරි චරිතය අධ්‍යයනය කරන්නැයි ඇය මට යෝජනා කරනවා. එය මට විශ්වාස කළ නොහැකි යථාර්තයක්. අද වන විට ක්ෂේත්‍රයේ දැවැන්තයින් බවට පත් වී සිටින විශ්වජිත් ගුණසේකර , නාමල් ජයසිංහ වැනි දක්ෂ චරිතාංග නළුවන් එවකට මා සමඟ එම වැඩමුළුවට සහභාගී වූ සිසුන් අතර සිටියා. ඔවුන්ගෙන් විශාල සහයෝගයක් සහ ධෛර්යයක් මට ලැබුණා. ජීවිතයේ පළවෙනි වතාවට යම් අරමුණක් වෙනුවෙන් කැපවී වැඩ කරන්නට සහ එය සාක්ෂාත් කරගන්නට ප්‍රබල පෙළඹවීමක් මා තුල ඇතිකිරීමට ඇගේ එම යෝජනාව සමත්වුණා. අවසානයේදී හිමකුමාරි මංගල දර්ශනය වේදිකා ගත කරද්දී හිම කුමාරි ලෙස රංගනයේ යෙදෙන්නට තරම් මා වාසනාවන්ත වුණා. විශාල වේෂ නිරූපණයකට ලක්වන්නටත් එම චරිතය වෙනුවෙන් ගායනය නර්තනය වැනි මා කිසි කලෙක අභ්‍යාසයේ නොයෙදුණු විෂයයන් වල යෙදෙන්නටත් මට සිදුවුණා.

සෝමලතා සුබසිංහ යනු නිතරම නවකයින් හඳුන්වා දෙන නාට්‍යවේදිනියක් සහ නියම දක්ෂයින් හඳුනා ගැනීමේ අසාමාන්‍ය ඉවක් තබූ ආදරණීය ගුරුවරියක්. මා හිම කුමාරි බවට පත් කිරීම තුලින් ඇය ඇයවම අභියෝගයකට ලක්කළා යැයි අතීතය විශ්ලේෂණය කිරීමේදී මට දැන් සිතෙනවා.ඒ පුහුණුවීම් කාලය කටුක වුවත් අප ඒ තුල ගැලී සිටමට තරම් ආශක්ත වන්නේ ඇය තුල පවතින කිසියම් ආකර්ෂණීය ගුණාංග සමූහයක් හේතුවෙන් බව ආපස්සට සිතා බැලීමේදී වර්තමානයේ මට පැහැදිලි වෙනවා. සෝමලතා සුභසිංහ විසින් යෞවනයන්ට නොමිලේ නාට්‍ය අධ්‍යාපනය ලබාදීම වෙනුවෙන් ආරම්භ කළ කෝට්ටේ ළමා හා යොවුන් රංග පීඨය නම්වූ නාට්‍ය පාසලෙන් බිහි වූ විශිෂ්ඨ රංගන ශිල්පීන් බොහොමයක් අද ක්ෂේත්‍රය තුල ස්ථාවර වී සිටිනවා. ඇය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගෙන් ආභාෂය ලැබූවත් පසු කාලීනව ස්වකීයම වූ නාට්‍ය ශානරයක් ගොඩනැගූ විශිෂ්ඨ ස්ත්‍රී කලාකාරිනියක්. ඇය ද්විභාෂා හැසිරවීමේ හසල දැනුමක් ඇති කෘතහස්ත නාට්‍යවේදිනියක්. එතුමිය වෙතින් පුහුණුව ලබා රංගනයට ප්‍රවිශ්ඨ වන්නට ලැබීමම භාග්‍යයක් ලෙසයි මා දකින්නේ. ඒ පුහුණුව රංගන ශිල්පිනියකට ලැබෙන කදිම අඩිතාලමක්. එය එතරම්ම පර්පූර්ණ පුහුණුවක් යන්න ඇගේ සෙවනේ උගත් ඕනෑම සිසුවෙක් පාහේ එකඟ වන කාරණයක්.

**ළමා හා යොවුන් රංග පීඨයේ නාට්‍ය බොහොමයකට සම්බන්ධ වී සිටි ඔබ කාලයත් සමඟ සිනමාවට අවතීර්ණ වෙනවා බූඩ කීර්තිසේනගේ "මිල්ලෙ සොයා" චිත්‍රපටය සමඟින්. එය සිනමාවේ කිසියම් ආකෘතිකමය වෙනසක් ඇති කළ සිනමා පටයක්. කෙසේ වෙතත් බූඩගෙන් පසුව සිනමාවේ දැවැන්තයින් වන අශෝක හඳගම සහ ප්‍රසන්න විතානගේ වැනි සිනමාකරුවන් සමඟ සිදුකෙරෙන සංවාදය තුල කලාත්මක සිනමාවේ භාවිතාවන් පිළබිඳව ඔබ ලබන නිරාවරණය (exposure) කෙබඳුද?**

**නදී**

මිල්ලෙ සොයා සමඟ සම්බන්ධ වෙන්න ලැබෙන අවධිය වෙද්දි මා විකෘති නාට්‍යයේ ප්‍රියංගනී චරිතය, රත්මලී ඇතුළු සෝමලතා සුබසිංහ මහත්මියගේ නාට්‍ය බොහොමයක ප්‍රධාන චරිතයන් වලට පන පොවමින් දිවයින පුරා දර්ශන වාර වලට සම්බන්ධ වෙමින් සිටියා. එහි මහේන්ද්‍ර පෙරේරාගේ නැගණිය ලෙස මා රංගනයෙන් දායක වෙනවා. මේ වනවිට විකෘති නාට්‍යයේ මගේ රංගනය දුටු අශෝක හඳගම ඔහුගේ "මේ මගේ සඳය" චිත්‍රපටයට මාව සම්බන්ධ කරගන්නවා. අශෝක හඳගම වැනි විශිෂ්ඨ අධ්‍යක්ෂවරුන් සමඟ ආරම්භයේදීම කටයුතු කරන්නට ලැබීම එක්තරා භාග්‍යයක්. පසුව ප්‍රසන්න විතානගේ ඔහුගේ "ඉර මැදියම" සිනමාපටයට මාව සම්බන්ධ කරගන්නවා. මෙවන් අධ්‍යක්ෂකවරුන් සමඟ කටයුතු කරන්නට ලැබීමම සිනමා කර්මාන්තය පිළබිඳව හොඳ අධ්‍යාපනයක් ලබා ගැනීමට මග පෑදීමක්. ඉර මැදියම චිත්‍රපටයේදී මා හඳුනාගත් තවත් අද්විතීය රංගන ශිල්පියෙක් තමයි පීටර් අල්මේදා. ඔහු සමඟ "කලුමාලි" වේදිකා නාට්‍යයෙත් මා රංගනයේ යෙදුණා. කලුමාලි වේදිකා නාට්‍ය පිටපත මාත් රුවන්ති චිකේරාත් එක්ව ලියූ නාට්‍ය පිටපතක්. රුවන්ති ඉංගිරිසි වේදිකාව සමඟ සම්බන්ධ වී සිටි නාට්‍ය ශිල්පිනියක්. ඈ මගේ විශ්ව විද්‍යාල මිතුරියක්. අප දෙදෙනා එක්ව රචනා කළ කලුමාලි නාට්‍යයේ සිංහල නිෂ්පාදනයේ මා සමඟ ප්‍රධාන චරිතය රඟපෑවේ පීටර් අල්මේදායි. කලුමාලි නාට්‍යයේ ඉංගිරිසි නිෂ්පාදනයත් මීට සමගාමීව වේදිකාගත වුණා. පසු කළෙක විවාහය දරුවා සහ රැකියාව වැනි තීරණාත්මක කාරණා සමඟ සිනමාවෙන් මුළුමනින්ම වගේ වියුක්ත වී වසර ගනනාවක්ම මා මගේ කුටුම්භ ජීවිතයේ අප්‍රමාණ වගකීම්, බැඳීම් සහ සංකීර්ණතා සමඟ ගෙවා දැමුවා. ඒ කාලසීමාව තුල ලැබුණු යම් යම් අවස්ථා මා විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවේ මගේ වපසරිය පිළබිඳව මා තුලම නිවැරදිව ගොඩනැගුණු යහපත් විශ්වාසයක් නොමැති කම නිසා බව අද මට පැහැදිලිවෙනවා. ජීවිතයේ පරිණතිය සමඟ අප විසින්ම බොහෝ දෑ අවබෝධ කරගනු ලබනවා. එය තමා ලෝක ස්වභාවය.

**නිර්මාණයකට සම්බන්ධවීමේදී එහි තිරරචනය පිළබිඳව ඔබ කොතෙක් දුරට අවධානය යොමු කරනවාද? තිරපිටපත යනු යම් නිර්මාණයකට සම්බන්ධ වීමට ඔබව පොළඹවන කාරණයක්ද?**

**නදී**

පැහැදිලිවම මෙහිදී මා විශේෂයෙන්ම සඳහන් කළ යුතුයි අපේ රට වැනි නිර්මාණ අතළොස්සක් සිදුවන භූමියක ජීවත්වෙද්දි අප ලැබෙන අවස්ථාත් තෝරා බේරා ගැනීමකට ලක්කළොත් අපට වෘත්තීය රංගන ශිල්පිනියන් ලෙසින් මුවහත් වීමට ලැබෙන වාර ගනන කප්පාදු වීමකට ලක්වන්නට පුළුවන්. එය අප විසින් අප වෙතම සිදුකරගනු ලබන බලවත් වෘත්තීමය හානියක් ලෙස දකින්නට තරම් මට අද විවෘත මනසක් තබීම ගැන මා තෘප්තිමත් වෙනවා.

28 වන පිටට

සන්නස වෙනුවෙන්
සාකච්ඡා කර සම්පාදනය කළේ
උපේක්ෂා සේනානායක



